### ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ

# පරමේෂ්වරී සහ වෙනම රටක්

ලක්ෂ්මන් කොඩිතුවක්කු යනු සිඩ්නි නුවර වෙසෙමින්, මෙරට පුවත්පත්වලට මෙන්ම ශ්‍රී ලාංකික පුවත්පත්වලටද කෙටිකතා හා කවි සපයන ලේඛකයෙකි. 'පැය අටේ මිත්‍රයෝ ' නැමැති කාව්‍ය සංග්‍රහයට අමතරව ඔහුගේ මුල්ම කෙටි කතා සංග්‍රහය වනුයේ 'පරමේෂ්වරී සහ වෙනම රටක් ' නැමැති කෙටි කතා එකතුවයි. 2009 දෙසැම්බර් මස 'ෆාස්ට් ඇඩ්ස් ' වෙතින් ප්‍රකාශනයට පත්කර ඇති මෙම ග්‍රන්ථය, කොල්වින් සෙට්ටිනායකගේ අලංකාර පිටකවරයෙන්ද, ප්‍රසිද්ධ ලේඛකයකු, නාට්‍යකරුවකු, විශ්ව විද්‍යාල බාහිර කථිකාචාර්යවරයෙකු වන රංජිත් ධර්මකීර්තිගේ පිටවදනකින් ද සැරසී ඇත.

ඔහුගේ කතා පෙළගැස්මෙහි කෙටිකතා දහයක් අඩංගුවේ. මින් කිහිපයක් ඔහු, මව්රටෙන් ඈත්ව විදේශයකදී ලබාගත් අත්දැකීම්ය. අනෙක්වා විදේශයක උපන්නත්, නිතර මව්බිමේ සැරිසරන සිත නිසා ගොඩ නැගී ඇති ඒවා ය.

ඔහුගේ කෙටිකතා සියල්ල නිරීක්ෂණය කල විට , සංකීර්ණ ලෙස පෙනුණ ද, මූලික තේමාව වශයෙන් මතුව පෙනෙන්නේ 'සදාකාලික අරගලයක්' ලෙස හැඳින්විය හැකි 'දුප්පත් හා පොහොසත් පන්ති' අතර ඇති ගැටුමකි. එමෙන්ම පාඨකයා එම කතා තුළ ජීවත් කරවීමේ හැකියාවක් ඔහු සතුව ඇත්තේ ඔහු සාමාන්‍ය මිනිසා අතර හිඳිමින් ඒවා නිර්මාණය කර තිබීම නිසාය.

'වීරයකුගේ නවාතැන්පොළ' හි මිය ගිය ගුණවීර වටා ගොඩනැගුණු චරිත ද, 'මොහොමඩ්ගේ කතා වස්තුවෙහි' මොහොමඩ් ද, 'ඩිජිරිඩුවක දෝංකාරයෙහි' පින්ගුද, 'චිත්තරකාරයා' කතාවෙහි එන චිත්‍රසේනගේ චරිතවලින් ද මෙය ඉස්මතු වී පෙනේ.

සංකේත මගින් තම කතා ඉදිරිපත් කිරීමේදී ඔහු දරා ඇති ප්‍රයත්නයද ප්‍රශංසනීයවේ. 'ඩිජිරිඩුවක' එන පරෙවියා, මොහොමඩ්ගේ කතාවෙහි දක්නට ලැබෙන තොරණ, 'ආදරයයි සාගරයයි' හා 'ආදරවන්තයෝ' හි විස්තර වන මහ මුහුද මෙහිදි වැදගත් වේ. දේශපාලන, සමාජීය හා ආගමික නොසන්සුන්තාවයක් තිබූ 19 වන සියවසේ රුසියානු සමාජයේ මිනිසුන්ගේ මානසික ගැටළු උකහා දක්වමින් ග්‍රන්ථ රචනා කළ 'ෆියඩෝර් ඩොස්ටොව්ස්කි' හා 'නිකොලොයි ගොගොල්' වැනි ලේඛකයන් මනසට නැගෙන්නේ ඔහුගේ මේ දක්ෂතාව නිසාය.

ලක්ෂ්මන් කොඩිතුවක්කුගේ භාෂාව සරලය. එඩිතරය. නොකැඩී ගලායන විලාශයකින් පාඨකයාගේ හද බැඳ තබාගැනීමට ඔහු සමත්ව ඇත. දේශයට ගැලපෙන පරිදි බස හැසිරවීමත්, ඉන් අපූරු, නැවුම් චමත්කාරයක් දීමටත්, ඔහුගේ කෙටිකතාවලට හැකිව ඇත්තේය.
'ඇපල් පැළෙන සිනහව.......' (74 පිටුව)

'ලැව් ගින්නට අසුවී මහා වනාන්තරයක්සේම දැවෙනා තම හදවත් ගින්න....' (18 පිටුව)

'ගෑරුප්පුව හදිසියේම තිරිංග තද කළ වාහනයක්සේ ක්ෂණිකව නතර කළේය.....' (32 පිටුව)

'සෙනෙහස ටිකෙන් ටික දියව ගියේ සියොළඟ උළන සබන් කෑල්ලක් මෙනි....' (15 පිටුව)

'දියණියගේ මුවින් සුනාමියක්සේ ගලා හැලෙන වාක්‍ය මාලා.... ' (15 පිටුව)

යන වාක්‍ය කොටස්වලින් මේ බව මොනවට පැහැදිලි වේ.

ඔහුගේ කෙටිකතා දහය අතුරින් 'වීරයෙකුගේ නවාතැන්පොළ' , 'මොහොමඩ්ගේ කතාවස්තුව' , 'ආදරවන්තයෝ' සහ 'චිත්තරකාරයෝ' වෙනත්ම අයුරකට ගොඩනැගුණු කතා ලෙස දකිමි.

'ආදරවන්තයෝ' හි හංසිගේ මේ දෙබස් තුළින්, යොවුන් වියෙහි දැරියකගේ මනසෙහි මැවෙන සිතුවිලි සමග උපහාසාත්මක රසයක්ද රචකයා විසින් මතුකරනු පෙනේ.

'මුහුදේ පෙණකැටි මතුවෙන්නේ ආදරවන්තයින් වෙනුවෙන්. හද වලාකුළු වලින් වහගන හැංගිලා බලා ඉන්නේ ආදරවන්තයෝ වෙනුවෙන්.... මල් පිපෙන්නේ ආදරවන්තයෝ වෙනුවෙන්. අහසේ තරු නැතත් තරු මවලා ප්‍රේමවන්තිට පෙන්වන්න ඕනි....'

'මුහුද මැද දිය කිඳුරියො මවලා ඒ ප්‍රේමවන්තයින්ගේ හදවතේ චිත්‍ර අඳින්න ඕන. පායපු හඳ බිමට බස්සලා එක උඩ එක නැගලා පියඹලා ගිහින් ප්‍රේම කරන්න ඉගෙනගන්න ඕනි....' (පිටුව 92)




ඔහුගේ සෑම කතාවක්ම කියවා රසවිඳිය හැකි, පාඨකයාගේ විශ්වාසය දිනාගන්නා ඒවාය.

සෝමපාල ජයකොඩි හා ජගත් ජේ. එදිරිසිංහ සෝදුපත් බලා ඇති බවක් පෙරවදනෙහි සඳහන් වන මුත්, පෙනෙන්නේ උක්තානුක්ත භේදයක්, උක්ත ආඛ්‍යාත සම්බන්ධයක් කතුවරයා හරිහැටි අනුගමනය නොකරන බවකි.

'මගේ නෙතුසඟල පැහැර ගත්තාය.... (පිටුව 22)

'මම නිහඬය' (පිටුව 27)

'හිමිදිරියෙන්ම ලකලෑස්තිවී පිටත්වූ අපිට එදා සුනාමි විපතින් අසරණවූ බොහෝ දරුවන් මුණගැසුණි' (පිටුව 29)

'අපි අදද එසේ යන්නට කතාකර ගත්තේ, ගසක් යට හිඳ ලබන සිසිල, නිවසක වහලයක් නොදෙන බව ශ්‍රීමා නිතරම කියන නිසාය....' (පිටුව 53)

'පිරිමි දරුවන් දෙදෙනා දියණියද සමඟ ගෙට රිංගුවේය ! (පිටුව 66)

මේ ඒ සඳහා ඉදිරිපත් කළ හැකි උදාහරණ කිහිපයකි.

දක්ෂ ලේඛකයෙකු තුළ තිබිය යුත්තේ ඔහුට සරිලන අන්දමේ, සුමග, නිවැරදි ශෛලියකි. ලේඛකයාගේ අමුද්‍රව්‍ය වන්නේ භාෂාවය. ඔහු හෝ ඇය තම භාෂාව හසුරුවා ගැනීමට සමත්විය යුතුය. එය සකස් කර ගැනීමට උත්සහ ගත්තේ නම්, ලේඛකයාගේ නිර්මාණ මීටද වඩා සාර්ථක කරගත හැකිව තිබිණි.

කෙසේ වෙතත් අද දක්නට ලැබෙන බොළඳ ප්‍රේම කතා දෙස බලනවිට, ලක්ෂ්මන් කොඩිතුවක්කුගේ 'පරමේෂ්වරී සහ වෙනම රටක් ' සිටින්නේ බොහෝ ඉදිරියෙන් බව කිව යුතුය.

හේමමාලා හේරත්

MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with years of experience who can deliver the results

Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED REGISTRATION NUMBER 0320696

For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au